**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක II - 2022**

------------------------------------------------------------------------------------------------

ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක II හි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව අතර 2018 මැයි 16 දිනැතිව එළඹි අංක. 8878 එල්කේ දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව,එවකට පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහයෝගයෙන් එවකට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතියේ විධායක සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. රටේ තෝරාගත් ප්‍රදේශවල ඉහළ අවදානම් සහිත ජන කණ්ඩායම්වල බෝ නොවන රෝග හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම අවධාරණය කරමින් ප්‍රාථමික සෞඛ්‍ය සේවාවල භාවිතය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණ වේ. (අ) ප්‍රාථමික සෞඛ්‍ය සේවා ප්‍රතිසංවිධානය හා ශක්තිමත් කිරීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම (ආ) නවෝත්පාදන ප්‍රදාන සහ ක්‍රියාත්මක කිරීමට සහාය දැක්වීම (ඇ) අවිනිශ්චිත හදිසි ප්‍රතිචාර දැක්වීම නමින් වූ කොටස් තුනක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 697,936.86 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 4,419 ක් වන අතර ඉන් රු. මිලියන 31,588 කට සමාන වූ එක්සත් ජනපද ඩොලර් මිලියන 200 ක් මූල්‍යයනය කිරීමට ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව එකඟ වී තිබුණි. එයින් රු. මිලියන 2,368.27 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලයන 15.00 ක් ව්‍යාපෘතියේ සංරචක - **II** යටතේ සිදුකිරීමට නියමිත ක්‍රියාකාරකම් සඳහා වෙන් කර තිබුණි. පසුගිය වර්ෂය තුළ මෙම සංරචකය සඳහා වෙන් කරන ලද මුදල එක්සත් ජනපද ඩොලර් මිලියන 6.00 ක් දක්වා අඩු කර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2019 පෙබරවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට එහි කටයුතු නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර**,** 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය**,** වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහයන් පිළිබඳ සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධව වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී . වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| ගිණුම්කරණ අඩුපාඩුව / විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිති 5 හි 43 (අ) වගන්තියට අනුව ව්‍යාපෘතියේ වත්කම් සහ බැරකම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශ කිරීමේ දිනට විදේශ විනිමය අනුපාතයට පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ විදේශ ණය සම්බන්ධ සමානාත්මතා ගැලපීම් ගිණුම්ගත කර නොතිබුණි. | 106.7 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ CS-DRMS වාර්තාවේ 814-1(V2) අනුව, පොලී වියදම් සහ කැපවීම් ගාස්තු විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ගෙවනු ලැබේ. ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ලබාගෙන නැවත ගිණුම්ගත කිරීමක් අවශ්‍ය නොවේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කළ යුතු අතර ශේෂයන් ගැලපීම සිදු කළ යුතු ය. |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 753(1) සහ 753(2) දරන මුදල් රෙගුලාසි | ව්‍යාපෘතියේ භාණ්ඩ නිකුත් කිරීම් සහ ලැබීම් වලට අදාළව අවස්ථා 16කදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිකුත් කිරීමේ නියෝග 16 ක් සඳහා ලැබීම් නියෝග රිසිට්පත් පහක් ව්‍යාපෘති කාර්යාලයට ලැබී ඇත. ඉතිරි 12 සඳහා ලැබීම් නියෝග එවා නැති ආයතන ප්‍රධානීන් වෙත හැකි ඉක්මනින් ලැබීම් නියෝග එවන ලෙස දැනුම් දෙන ලදී. | මුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතු ය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන සඳහා ඩිජිටල් සංඥා පද්ධති 600 ක් සැපයීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා රු. මිලියන 77 කට (බදු හැර) 2021 මැයි 07 දින ගිවිසුම් ගතවී තිබුණි. අවසාන ගෙවීම ලෙස රු. මිලියන 17ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. කෙසේ වෙතත්, 2023 මැයි 22 විගණිත දිනය වන විට මෙම ඩිජිටල් සංඥා පද්ධති 600 න් 285 ක් නිසි ක්‍රියාකාරී තත්ත්වයේ නොමැති බව අනාවරණය විය. | ඉතිරි ඩිජිටල් සංඥා පද්ධති 285 මධ්‍යම සම්ප්‍රේෂණ පද්ධතියට සම්බන්ධ කිරීමට සෞඛ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් නුදුරු අනාගතයේ දී කටයුතු කරනු ඇත. මේ සඳහා ඩිජිටල් සංඥා පද්ධතියේ ක්‍රියාකාරීත්වය සම්පව අධීක්ෂණය කිරීම සඳහා දිස්ත්‍රික් නිලධාරීන් සමඟ මෙහෙයුම් කමිටුවක් පත් කර ඇත. | අලුත්වැඩියා කර වහාම භාවිතයට ගැනීමට කටයුතු කල යුතු ය. |

**3.2 මතභේදාත්මක ගනුදෙනු**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 09 වැනි දින සිට සති 10ක් අන්තර්ජාලය ඔස්සේ පවත්වන ලද "LSE Public Policy Analysis" නම් පාඨමාලාවට සහභාගී වූ නිලධාරීන් 05 දෙනෙකු වෙනුවෙන් ලන්ඩන් පාසල වෙත රු.මිලියන 2.6ක් ගෙවා තිබුණි. මෙම ආයතනය තෝරා ගැනීමට අදාළ පදනම පිළිබඳ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වැඩසටහන සාර්ථකව නිම කිරීමෙන් පසු ලන්ඩන් පාසල විසින් සහතික නිකුත් කරන ලදී. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඉල්ලීම මත කළමනාකරණ, සංවර්ධන හා සැලසුම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ ප්‍රතිපත්ති විශ්ලේෂණ සහ එම ඒකකයේ නිලධාරීන් මෙම වැඩසටහන සඳහා නම් කරන ලදී. | තෝරාගත් නිර්ණායක සහ අනෙකුත් ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 07 වැනි දින රු. 178,000 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් අස්ථානගත වී තිබුණි. මුදල් රෙගුලාසි අංක 104 (3) සහ 104 (4) අනුව අදාළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මූලික වාර්තාව 2022.09.26 දින අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර ඇත. F.R 104(4) අනුව. 2022.01.10 දින මණ්ඩලයක් පත් කර ඇති අතර දැනටමත් පරීක්ෂණය ආරම්භ කර ඇත පරීක්ෂණයේ ප්‍රගතිය විගණකාධිපතිවරයාට දැනුම් දෙමි. | මුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතු ය. |
| (ඇ) | ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ ජ්‍යෙෂ්ඨ සන්නිවේදන නිලධාරියාට ව්‍යාපෘතියෙන් ගෙවිය යුතු වැටුපට වඩා රු. 453,337 ක් වැඩිපුර ගෙවා තිබුණි. වැඩිපුර ගෙවා තිබූ වැටුප වාරික වශයෙන් අය කර ගත යුතු බවට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා දැනුම් දුන් බව සඳහන් කලද, එවැනි ලිපියක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන බැවින් ඊට පෙර වැඩිපුර ගෙවූ වැටුප අය කළ යුතු බවත්, මෙම වැඩිපුර ගෙවීම සිදු වූයේ කෙසේ ද යන්න කරුණු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ජ්‍යෙෂ්ඨ සන්නිවේදන නිලධාරියා වෙත වැඩිපුර ගෙවූ වැටුප අය කිරීමේ වාරික පදනම සෞඛ්‍ය ලේකම්වරයා විසින් ව්‍යාපෘති කාර්යාලයේ නිර්දේශය මත තීරණය කරන ලදී. කෙසේ වෙතත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී, ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ අදාළ නිලධාරියා වෙත සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වැඩිපුර ගෙවූ වැටුප අය කිරීම සඳහා උපදෙස් ඇතුළත් විධිමත් ලිපි නිකුත් කිරීමට දැනටමත් කටයුතු කර ඇත. | ව්‍යාපෘතිය අවසන් වීමට පෙර වැඩිපුර ගෙවූ වැටුප අය කර ගත යුතු අතර මේ සම්බන්ධයෙන් වගකිව යුතු අයට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු ය. |